# රුහුණ විශ්වවිද්‍යාලය

## වෛද්‍ය පීඨය, කරාපිටිය, ගාල්ල.

## ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කුලී පදනම මත ධාවනය වන කිලෝමීටර් ප්‍රමාණයට ගෙවීමේ පදනමින් වාහන ලබාගැනීම

ගාල්ල, කරාපිටිය පිහිටි රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ භාවිතය සඳහා ඩීසල් වලින් ධාවනය වන ද්විත්ව වායු සමනය සහිත මගින් ප්‍රවාහනය සඳහා ලියාපදිංචි ( Passanger vehicles )වෑන් රථ, වායු සමනය සහිත ද්විත්ව කාර්යය සඳහා ලියාපදිංචි (Duel Purpose Vehicles ) වෑන් රථ, වායු සමනය සහිත මෝටර් කාර් රථ, වායු සමනය රහිත ආසන 54 ට නොඅඩු බස් රථ , වායු සමනය රහිත ආසන 32ට නොඅඩු බස් රථ සඳහා කිලෝමීටර් ප්‍රමාණයට ගෙවීමේ පදනම මත වාහන සැපයීමට හැකි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා ඉදිරිපත් කරනු ලබනු වෑන් රථ නිෂ්පාදිත වර්ෂයේ සිට වසර 08 ක් ඉකුත් නොවිය යුතුය.

අදාල අයදුම්පත් හා අදාල ලේඛණ ආපසු නොගෙවන රු.250.00 ක මුදලක් කරාපිටිය වෛද්‍ය පීඨයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් පසු ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, වෛද්‍ය පීඨය වෙතින් 2022.06.08 දින ප.ව 4.00 දක්වා ලබාගත හැකිය.

අයදුම්පත් සමග වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකය, අදාල වර්ෂයේ ආදායම් බලපත්‍රය, රක්ෂණ සහතිකය සහ අදාල රියදුරු මහතාගේ රියදුරු බලපත්‍රය යන ලේඛනයන්හි සහතික කල ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල ලිපි ලේඛණ සමග 2022.06.08 දින ප.ව. 2.00 ට හෝ ඊට ප්‍රථම ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, වෛද්‍ය පීඨය, කරාපිටිය, ගාල්ල යන ලිපිනයට ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ගෙනවිත් භාර දෙන්නේනම් ඔබගේ ටෙන්ඩර්පත් 2022.06.08 දින ප.ව. 2.00 ට පෙර රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වෛද්‍ය පීඨය සඳහා කුලී පදනම මත වාහන සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

ටෙන්ඩර්පත් භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම ටෙන්ඩර්පත් විවෘත කරන අතර ටෙන්ඩර් අයදුම්කරුට හෝ ඔහුගේ අනුමැතිය සහිදි එක් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

අපැහැදිලි, අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර්පත් කිසිදු හේතුවක් නොදන්වා විශ්වවිද්‍යාලය මගින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර රුහුණ විශ්වවිද්‍යාලයීය ප්‍රසම්පාදන මණ්ඩලය ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ලේඛකාධිකාරී
රුහුණ විශ්වවිද්‍යාලය
2022.05.25